කුච්චවේලි ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 19 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 13 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 29 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගවමස් කඩවල වසර 12 ක් පුරා හිඟහිටි බදු ප්‍රමාණය රු.2,966,526 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ පටන් ලැබිය යුතු වෙළඳපළ කඩ කාමර හිඟ කුලී වාහන කුලී බැංකු පොලී සහ ආයෝජන එකතුව රු.1,042,614 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 32 කට පෙර විශ්‍රාම ගිය සේවකයන් 5දෙනෙකුගේ එකතුව රු. 8,500 ක්වූ ඇප තැන්පතු ආපසු ගෙවීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රු. 7,591 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල ලබාගත් අත්තිකාරම් ලෙස 2005 වර්ෂයේ පටන් දිගින් දිගටම පෙන්වා තිබුණි. එම අත්තිකාරම් හඳුනාගෙන ගිණුම් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1996 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ නොගෙවූ වැටුප් හා වේතන රු. 442,426 ක් ගෙවීමට හෝ ගිණුම් පොත්වලින් කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

---------------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| නොගෙවූ වැටුප් හා වේතන | 299,018 | විස්තරාත්මක ලැයිස්තුව |
| ආදායම් තැන්පතු | 156,649 | තැන්පතු ලේඛනය |

1.3.4 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) | මුදල්, ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීම් සඳහා වූ පරිපාලනමය වශයෙන් රාජකාරි පවරනු ලැබූ නිලධාරීන් 03දෙනෙකුගෙන් ආරක්ෂිත ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i)අංක 396 | මාස 06 කට අධික කාලයක් තිස්සේ ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු. 335,531 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | (ii)අංක 571 | රු. 12,423,615 ක් වූ වසර 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,987,430 ක්වූ අතර එය ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ රු. 34,820,840 සමඟ සැසඳූ විට රු. 14,833,410 ක මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

----------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත ආදායම | තත්‍ය ආදායම | ආදායම් එකතුව 2016 දෙසැම්බර් 31 දිනට හිඟ |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,270 | 6,185 | 6,649 |
| බදු කුලී | 4,166 | 3,810 | 3,319 |
| බලපත්‍ර ගාස්තු | 1,260 | 1,372 | 4 |
| සේවා ගාස්තු | 140 | 150 | 4 |
| අනෙකුත් ආදායම් | 10,881 | 14,399 | 8,199 |

2.2.2 වරිපනම් හා බදු

1987 අංක 15 ප්‍රදේශීය සභා පනතේ 134 වගන්තිය මගින් නියම කර ඇති පරිදි 2005 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සභා බල ප්‍රදේශය තුළ වූ ඉඩම්, ඉදිකරන ලද ගොඩනැගිලි සහ නිවාසවලින් ලැබිය යුතු රු. 6,646,115 ක්වූ වරිපනම් හා බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) අනෙකුත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලද වාහන 08 ක් වසර 06 ක් සභාව විසින් භාවිතා කර තිබූ නමුත් අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් නියමකර ඇති පරිදි සේවකයන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා සභාව විසින් යන්ත්‍රයක් සවිකර නොතිබුණි.

(ඇ) පුල්මුඨ්ටායි සහන කඳවුරේ වූ පුද්ගලයන්ගේ සුබ සාධනය සඳහා 2009 වර්ෂයේදී යලි පදිංචි කිරීමේ අමාත්‍යාංශය වෙනුවෙන්, සභාව විසින් රු. 2,354,448 වියදමක් දරා තිබුණි. මේ දක්වා අමාත්‍යාංශය විසින් මෙම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඈ) 2006 සිට 2011 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.15,605 ක්වූ නිෂ්කාෂණය නොවූ චෙක්පත් 05 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) ජල සම්පාදන යෝජනා ක්‍රමයට සම්බන්ධයෙන් 2013 වර්ෂයේදී රු.700,000 ක්වූ අත්තිකාරම් ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදී තිබුණි. මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ස්ථාන මාරුවී ගිය හෝ තනතුරු හැරගිය සේවකයන් 10දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 273,545 ක්වූ ණය ශේෂ සේවකයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2015 වර්ෂයේදී සභාව විසින් භාවිතා කළ ජීප් රථය මුළුමනින්ම විනාශයට පත්ව තිබුණි. එනමුත් මු.රෙ 104 විධිවිධාන ප්‍රකාර අලාභය තක්සේරු කර වගකිව යුතු පුද්ගලයන් හඳුනාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඌ) 2002 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ සභා සේවකයන්ට හා වෙනත් ආයතනවලට දෙනලද එකතුව රු. 3,744,138 ක්වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2014 නොවැම්බර් 12 දිනැති අක 25/2014 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය නොමැතිව, 2015 වර්ෂයේදී සභා ලේකම් විසින් අනියම් පදනමට සේවකයන් 140දෙනෙකු පත් කර තිබුණි. එනමුත් එවැනි පත්කිරීම් සඳහා අවශ්‍යතාවයක් නොවිය. හිටපු ලේකම් විසින් එම සේවකයන්ට ගෙවීම සඳහා 2015 වර්ෂයේද රු. 1,493,294 ක අත්තිකාරම් ලබාගෙන තිබූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි.

(ඒ) 1987 අංක 15 ප්‍රාදේශී සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව , සභා බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන සංචාරක බංගලාවල වසරක මුළු ආදායමින් සියයට 1 ක් සභාව විසින් බදු වශයෙන් අයකර ගත යුතුවේ. එනමුත් මේ දක්වාම එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඔ) රු. 301,901 ක වියදමක් දරමින් අභ්‍යන්තර සම්බන්ධතා පද්ධතියක් 2015 වර්ෂයේ සවිකර තිබුණි. මෙය සවිකළ මාසය තුළදීම අක්‍රියවී තිබුණි. එය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් මේ දක්වාම මාසිකව රු. 10,170 ක මුදලක් ගෙවා තිබුණි.

(ඕ) 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිසමේ චක්‍රලේඛයේ 1.2 ඡේදයට අනුව, මාර්ග දිර්ඝ කාලයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා මාර්ගවල බොරළු ඇතිරීම වැනි තාවකාලික පියවර ගැනීමෙන් වැළකී, කාර්පට් කිරීම, තාර දැමීම සහ කොන්ක්‍රීට් කිරීමේ වැඩ කළ යුතු වේ.  ඒ නමුත්, චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින්, අල්හසා මාර්ගය රු. 1,622,947 ක පිරිවැයකින් සභාව බොරළු අතුරා තිබුණි.

(ක) මෝටර් ප්‍රවාහන පනතේ  203 වගන්තිය ප්‍රකාර, වාහන සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගත යුතු වේ.  ඒ නමුත් සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන 05 ක් සඳහා වාහන බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ග) ප්‍රධාන ලේකම්ගේ අංක 10/2009 චක්‍රලේඛයේ  2 වගන්තිය  අනුව සභාපති සහ එම වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය හැකි දීමනාව පිළිවෙලින් රු. 5,000 ක් සහ රු. 4,000 ක් වේ. ඒ අනුව  2015 වර්ෂය සඳහා එකතුව රු. 13,000 ක මුදලක්  ගෙවීය යුතුව තිබූ නමුත්, රු. 25,000 ක මුදලක් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන් රු.12,000 ක් වැඩියෙන් ගෙවීමක් කර තිබුණි.

(ජ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 21 දිනැති අංක 02/2011 චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව අනියම් හා තාවකාලීක පදනමින් පත්කරනු ලැබූ පළාත් පාලන සේවකයන් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීය යුතු වේ. එනමුත් චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින් සභාවේ එම සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා තිබුණි.  මේ අතර, දායක මුදල් නියමිත දිනට නොගෙවීම මත,2010 ජනවාරි සිට 2014 නොවැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු. 1,915,306 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවන ලෙස සේවක අර්ථසාධක අරමුදල විසින් ඉල්ලීමක් කර තිබුණි.

(ට) මධ්‍යම පරිසර අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවසර ලබා නොදුන්, පුල්මොටේ වැව පස්වලින් පුරවා රු. 24,444,588 ක පිරිවැයකින්, ප්‍රාදේශීය සභාව විසින් කඩ කාමර 35 කින් සමන්විත වෙළඳ සංකීර්ණයක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් නීති කටයුත්තකට මුහුණදීමේ අවදානමක් සභාවට පවතියි.

3.2 මතභේදයට ලක්වන ගනුදෙනු
------------------------------

සභාවේ සභාපතිවරයා 2015 පෙබරවාරි 05 දින සහ 2015 මාර්තු 23,24 සහ 25 දිනවලදී සභා බල ප්‍රදේශය තුළ වූ උපකාර්යාල සහ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට නිල චාරිකාවලයෙදී, නිල වාහනවල යොදන ලද ධාවන සටහන් මගින් ඔහුගේ චාරිකා තහවුරුව

තිබුණි. ඒ නමුත් එම දිනවලදී ඔහු කොළඹ නිල චාරිකාවල යෙදුණු බව දන්වමින් රු. 43,100 ක ගමන් වියදම් හා යැපීම් දීමනා ලබාගෙන තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත සඳහන් නිරීක්‍ෂයන් සිදුකෙරේ.

(අ) පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ වූ සංචාරක ව්‍යාපාරය සංවර්ධන සැලැස්ම යටතේ 2016 දෙසැම්බර් මස දී රු. 1,004,500 ක පිරිවැයකින් කෝකිලායි මුහුදු වෙරළේ සූර්ය බල ලාම්පු හතක් සවිකර තිබුණි. මෙම ලාම්පු අතුරෙන් රු. 430,500 ක් වටිනා ලාම්පු 03 ක් මාස 05 ක්ම අක්‍රියව තිබුණි. ඒවා අළුත්වැඩියා කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ පිරිවැය රු. 316,460 කට කට්ටුකුලම් ප්‍රදේශයේ පොදු ලිඳක් ඉදිකිරීම සඳහා ප්‍රජා මධ්‍යස්ථානයකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණ සිදු කෙරේ.

i. සභාවට සතු ඉඩමක් නොමැතිකම නිසා සභාව පොදු ලිඳ පෞද්ගලික ඉඩමක සාදා තිබුණි.

ii. කොන්ත්‍රාත්කරු කර්මාන්තය නිමකර 2016 දෙසැම්බර් 23 දින සභාවට භාරදී තිබුණි. අයිතිකරු ලිඳ වටා වැටක් ඉදිකර භාවිතාකර තිබූ බව විගණනයේදී සිදුකළ ස්ථානීය පරීක්‍ෂාවේදී හෙළි විය. ලිඳ තැනීමේ අරමුණ ඉටුව නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම

---------------------------------------

රු. 4,946,825 ක පිරිවැයකින් ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2015 ඔක්තෝබර් 19 දින සිල්මියා කොන්ත්‍රාත්කරුට පිරිනමා තිබුණි. මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ සිදුකළ මෙම ඉදිකිරීම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

i. මෙම ඉදිකිරීම සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ විදුලි පැපයීම, ජලය සැපයීම් සහ මධ්‍යස්ථානය වටා වැටක් ඉදිකිරීම ආදි කරුණු ඇතුලත්ව නොතිබුණි. එම නිසා ඉදිකිරීමෙන් පසුවද, මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගත නොහැකිවී තිබුණි.

ii. කර්මාන්තය 2015 දෙසැම්බර් 19 දින වන විට නිමකර සභාවට භාරදීමට නියමිතව තිබුණි. එනමුත් රු. 2,947,682 ක්වූ නිශ්ඵල වියදමක් දැරීමෙන් පසුව 2017 මැයි 16 දින කොන්ත්‍රාත්කරු විසින් කර්මාන්තය අතහැර දමා තිබුණි. සභාවට තම ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ වැඩසටහන ඉදිරියට ගෙන යාමට නොහැකි විය.

iii. සභා බල ප්‍රදේශය තුළ එකතු කෙරෙන අපද්‍රව්‍ය පරිසර ගැටළු අත්කරමින් පුල්මුටේ පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි.

3.4 අක්‍රිය වත්කම්

--------------

පහත සඳහන් නිරීක්‍ෂණ සිදුකෙරේ.

(අ) සීසෑමේ යන්ත්‍ර දෙකක්, පික් අප් රථයක්, යතුරු පැදියක්, ට්‍රිපර් රථයක් සහ J.C.B යන්ත්‍රයක් පිළිසකර කොට භාවිතා කළ හැකි වුවද, සභාව විසින් ඒවා පිළිසකර කිරීමට කටයුතු නොකිරීම නිසා වසර 01 සිට 04 දක්වා කාලයක් අක්‍රීයව තිබුණි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ නිලාවේලිහි රු.17,943,879 පිරිවැයකින් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. ඉදිකිරීම් කොට 2016 මාර්තු 26 දින භාරදෙන ලද මධ්‍යස්ථානය පිළිබඳ අවශ්‍ය ඉදිරි කටයුතු නොකිරීම නිසා එය අක්‍රීයව පැවතුණි. වැය කළ මුදල නිශ්ඵල වී තිබුණි.

4 ගිණුම්කටයුතු භාවය සහ යහ පාලනය

---------------------------------------

පිළිතුරු නොලත් විගණන විමසුම්

----------------------------------

දින 14 ක් තුළ පිළිතුරු සපයන ලෙස ඉල්ලා සිටිමින් 2016 මාර්තු මසදී විගණන විමසුම් තුනක් නිකුත් කර තිබුණි. මේ දක්වාම පිළිතුරු ලැබී නොතිබුණි.

5 පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ලෙජර විධිමත්ව යාවත්කාලීනව පවත්වා ගෙන යාම.<br>ii. වත්කම් වර්ගීකරණය. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාම.<br>ii. ගබඩා ලෙජරය විධිමත්ව පවත්වා ගෙන යාම. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | හිඟ ආදායම් අයකර ගැනීම. |